

මල්ලීන්ගේ
සිහිනය.
නිසිනි දුල්තෂා වීරසේකර

# මලිතිගේ සිහිනය


නිසිනි දුලන්යා වීරසේකර

කතෘ



පළමු දිගහැරීම

පාසල -: මහ/මහමායා බාලිකා විදුහල,මහනුවර

ඉගෙනුම ලබන පංතිය -: 1-B

කෘතිය පල කරන දිනය-: 10-02-2025

ISBN : IS38440

# පිදුම

මට අකුරු කියවූ දෙමාපියන්ට හා මට අකුරු ලියවූ ගුරුතුමියටත් ඉතා ආදරයෙන් පුදමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දන්ඩකි.ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණිය යුග කැපී පෙනේන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝදමත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි.දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුලින් විස්කම් පෑම එයට හේතුවයි.පාසල තුල පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂී සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදී කතෘ කරඳන අත්ථදස්සි මාහිපිමානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රධාය රට තුල යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණය ට යොමුකරන **"හෙරණ ගත්කරණී"** ව්‍යාපෘතිය හදුන්වා දෙන්නට විය.මෙම ශාස්ත්‍රීය හා ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි.

ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හදුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘත්‍ය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

මලිති හරිම හොඳ ළමයෙක්. එයා එයාගේ අම්මටයි තාත්තටයි හරිම ආදරෙයි.



මලිති ඉස්කෝලේදීත් හරිම හොඳ ළමයෙක්.ගුරුවරුන්ටත් හරිම කීකරුයි.මලිති එයාගේ යාළුවෝ හැමෝටම උදව්වක් ඕන වුන හැම වෙලාවකම හරිම කැමැත්තෙන් උදව් කළා. ඒ නිසා යාළුවො හැමෝම මලිතිට ආදරෙයි.

මලිති සතුන්ටත් හරිම කරුණාවන්තයි.ආදරෙයි.මලිති හරි ආසයි පුංචි බලු පැටවුන්ට.

දවසක් රෑ මලිති සුපුරුදු විදිහට අම්මටයි තාත්තටයි වැඳලා නිදා ගත්තා.



එදා මලිති හරි අපූරු හීනයක් දැක්කා.මලිති සුරංගනා ලෝකයක් දැක්කා.මලිතිට හරිම පුදුමයි....

හැම තැනම ලස්සන මල් පිපිලා සමනල්ලු පියාඹනවා.



මල් අතරින් ආපු ලස්සනම ලස්සන සුරංගනාවියක් මලිතිට කතා කලා.

“මලිති” මලිතිට හරිම පුදුමයි.

ඔයා කොහොමද මගේ නම දන්නේ?
මලිති ඇහුවා.

මම ඔයාලගේ ලෝකෙ දිහා බලනකොට මම දැක්කා දෙමාපියන්ට ගුරුවරුන්ට කීකරු හොඳ ළමයෙක්.මට ඇහුනා එයාට හැමෝම “මලිති” කියලා කතා කරනවා.අන්න එහෙම තමා මං ඔයාගෙ නම දැනගත්තේ.සුරංගනාවිය කිවුවා.

ඉතින් සුරංගනාවිය මලිතිවත් එක්කන් සුරඟන ලෝකයේ ලස්සන ලස්සන තැන් බල මින් අහසින් පියඹා ගියා.



එහෙම පියඹා ගොස් නැවත ආපසු සුරංගනාවිය මලිතිගෙන් ප්‍රශ්නයක් ඇසුවා."මලිති ඔයාට මං තෑග්ගක් දෙන්න කැමතියි.ඔයාට ඕන මොනවාද?"

මලිති කල්පනා කලා.මලිතිට ගෙදර සෙල්ලම් කරන්න කවුරුත් නෑ.ඒ නිසා මලිති මෙහෙම කිවුවා."අනේ මට ගෙදර සෙල්ලම් කරන්න කවුරුත් නෑ. මං ආසයි ලස්සන බලු පැටියෙක්ට." මලිති කිව්වා.



ටිකකින් සුරංගනාවිය ලස්සන සුදු පුළුං
බෝලයක් වගේ බලු පැටියෙක් මලිතිට දුන්නා.

මලිතිට හරිම සන්තෝසයි. මලිති සුරංගනාවියට ගොඩාක් ස්තූතිවන්ත වුණා. මලිති ආස කරන හොඳම තෑග්ගක් මලිතිට ලැබුණා. එයා හරීම සතුටින් පුංචි බලු පැටියා සමග සෙල්ලම් කරා.

එකවරම මලිති නින්දෙන් ඇහැරුණා. එලියත් වැටිලා කුරුල්ලොත් කෑගහනවා. ඒ හඬ මැද්දෙන් මලිතිට කූක් කූක්  කූක් කියල සද්දයක් ඇහුනා. මලිතිගේ ඇඳ ළඟ පෙට්ටියක් ඇතුලේ සුදුම සුදු පුළුං බෝලයක් වගේ බලු පැටියෙක්.

මලිතිට හරිම සන්තෝසයි.එයා ආසම කරන තෑග්ගක් එයාට ඇත්තටම ලැබිලා.එදා ඉදන් මලිතිට කිසිම පාලුවක් තිබුනේ නෑ.මලිති හරිම සතුටින් බලුපැටියා සමග කාලය ගත කලා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පරීක්ෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි.එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ  වගකීමකි.

පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනය ඵලදායිතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල්,කලාප,පළාත්,ජාතික හා ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි.මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පරීක්ෂණාත්මක සනාථ වේ.

මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණිය යුගයේ ස්මාට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහමායා බාලිකාවියන් ඩිජිටල්  වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක
සෙනෙවිරත්න මහලේකම්